සැ. යු.-මෙවර පළවන ගැසට් පත්‍රයේ V කොටසේ 2007 වර්ෂයේ ජනවාරි - මාර්තු කාර්තුවට අදාලව මුද්‍රණ ශිල්පීන්ගේ හා ප්‍රකාශකයින්ගේ ආඥාපනත යටතේ ලියාපදිංචි වූ පොත් නාමාවලියක් ඉංග්‍රීසි භාෂාවෙන් පළ වේ.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,655 - 2010 මැයි මස 21 වැනි සිකුරාදා - 2010.05.21**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | 1096 |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 1096 |
| පළාත් සභා විවිධ දැන්වීම් ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | 1097 |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2010 මැයි මස 26 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2010 මැයි මස 14 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2010 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# ආණ්ඩුකාරවරුන් විසින් කරන පත්කිරීම් ආදිය

**බස්නාහිර පළාත් සභාව**

ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත් කිරීම් ආදිය

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ පළාත් සභාවට පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමට බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවරයා වශයෙන් කරන ලද පත් කිරීම්**

| *අනු අංකය* | *නම/ධුරය* | *පත්කරන ලද ධුරය/ අමාත්‍යාංශය ක්‍රියාත්මක වන දිනය* |
|---|---|---|
| 01. | බස්නාහිර පළාතේ ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු, සමුපකාර සංවර්ධන, ආහාර සැපයීම් හා බෙදා හැරීම් සහ ග්‍රාම සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යවර ගරු හේවා මාතරගේ උපාලි කොඩිකාර මැතිතුමා | 2010.04.13 වැනි දින සිට බස්නාහිර පළාතේ මාර්ග සංවර්ධන, සත්ව නිෂ්පාදන හා සංවර්ධන, නිවාස හා ඉදිකිරීම්, ධීවර හා සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යවර ගරු ඇන්ටනී නිමල් ලාන්සා මැතිතුමා යළි දිවයිනට පැමිණෙන තුරු එකී අමාත්‍යාංශයේ වැඩබලන අමාත්‍යවරයා වශයෙන් පත් කිරීම. |

එස්. අලවි මව්ලානා,
බ. ප. ආණ්ඩුකාරවර.

කොළඹ 04,
යුනිටි ප්ලාසා ගොඩනැගිල්ලේ පිහිටි,
බ. ප. ආණ්ඩුකාර ලේකම් කාර්යාලයේ දී ය.

05-548

# පළාත් සභා නිවේදන

**ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ අන්සතු කිරීමට ඇති ඉඩම් සඳහා අවසරපත්‍ර ලැබීමට ගොවිජන පංතියට අයත් තැනැත්තන් නොවන තැනැත්තන් තෝරා ගැනීම සඳහා වූ ඉඩම් කච්චේරි පිළිබඳ නිවේදනය**

පහත විස්තර කර ඇති ඉඩම් සඳහා ඉල්ලුම්පත්‍ර සලකා බැලීමට සහ ඒවායේ ඉඩම් කොටස් සඳහා අවසරපත්‍ර ලැබීමට සුදුසු තැනැත්තන් තෝරා ගැනීමට ගල්ගමුව ප්‍රාදේශීය ලේකම්වරයා විසින් 2010 අගෝස්තු මස 04,05,06 යන දිනයන්හි පෙ. ව. 10.00 ට ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී රජයේ ඉඩම් ආඥාපනත යටතේ ඉඩම් කච්චේරියක් පවත්වනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

*(අ)* ඉඩමේ විස්තරය : අ.ග.පි. 3198 ගොජරාගම සහ 3822 කංකානියාගම,
*(ආ)* ඉඩමේ මැනුම් විස්තර : අ.ග.පි. 3198 ගොජරාගම කැබලි අංක 226 කොටසක් සහ යාබද කංකානියාගම කොටස,
*(ඇ)* ඉඩම පිහිටි ගම : ගොජරාගම සහ කංකානියාගම,
*(ඈ)* ග්‍රාම නිලධාරි කොට්ඨාසය හෝ කොට්ඨාස : අංක 60, මහගල්ගමුව
*(ඉ)* උප දිසාපති හෝ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාස : ගල්ගමුව
*(ඊ)* දිස්ත්‍රික්කය : කුරුණෑගල
*(උ)* අන්සතු කිරීමට ඇති ඉඩමේ ස්වභාවය/වාරිමාර්ග පහසුකම් සලසන ලද හා / හෝ වාරිමාර්ග පහසුකම් සලසා නොමැති) : වාරිමාර්ග පහසුකම් සලසා නොමැති ගොඩ ඉඩම.
*(ඌ)* අන්සතු කරනු ලබන ඒකකය :

1. වාරිමාර්ග පහසුකම් සලසන ලද ඉඩම : අදාළ නොවේ
2. ගොඩ ඉඩම : පර්චස් 15

2. පහත දැක්වෙන පංතියට හෝ පංතිවලට අයත් පුද්ගලයින්ගෙන් ලැබෙන ඉල්ලුම්පත්‍ර සලකා බලනු ලැබේ :

(1) අඩු ආදායම් ලාභීන්
(2) වැඩි ආදායම් ලාභීන්

ඉහත සඳහන් පංතියට හෝ පංතිවලට තමන් අයත් වන බව සනාථ කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නියම කරනු ලැබිය හැකි සාධක ඉල්ලුම්කරුවන් විසින් ඉදිරිපත් කළ යුතුය.

3. සියලුම ඉල්ලුම්පත්‍ර 2010.07.05 වැනි දින හෝ ඊට පෙර "ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ගල්ගමුව" වෙත ලැබිය යුතුය. සියලුම ඉල්ලුම්පත්‍ර නියමිත ආකෘතියේ විය යුතුය.

4. ඉල්ලුම්කරු ඉඩම් ලැබීම සඳහා සලකා බලනු ලැබීමට සුදුසු වන්නේ නම් 2010 අගෝස්තු මස 04,05,06 යන දිනයන්හි පෙ. ව. 10.00 ට ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී පැවැත්වෙන ඉඩම් කච්චේරියට පැමිණෙන ලෙස ප්‍රාදේශීය ලේකම්වරයා ඔහුට නියම කරනු ලැබේ. ඉඩම් ලැබීම

සඳහා සලකා බලනු ලැබීමට කැමති සෑම තැනැත්තෙක්ම පෞද්ගලිකව පැමිණිය යුතුය. එසේ නැතහොත් තමන් නියෝජනය කිරීම සඳහා වෙනත් අයෙකු ලියවිල්ලක් මගින් ඉදිරිපත් කළ යුතුය.

5. ඉල්ලුම්කරු හෝ ඔහු නියෝජනය කරන තැනැත්තා හෝ විසින් ඉල්ලුම්පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු සනාථ කෙරෙන සියලුම සාධක හෝ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නියම කරනු ලබන වෙනත් අදාළ තොරතුරු ඉඩම් කච්චේරියේ දී ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

6. තෝරාගනු ලබන සෑම ඉල්ලුම්කරුවෙකුටම මුල් අවස්ථාවේ දී අවසර පත්‍රයක් ලැබෙන අතර එය එහි සඳහන් කොන්දේසිවලට යටත් වනු ඇත.

7. අවසර පත්‍රයක් ලැබීමට තෝරාගනු ලබන සෑම තැනැත්තෙක්ම එසේ තෝරාගනු ලැබූ බව දන්වනු ලැබූ වහාම තමන් තෝරාගනු ලැබ ඇත්තේ කවර ඉඩමක් සඳහා ද ඒ ඉඩම වෙනුවෙන් අක්කරයකට රුපියල් 40,000 බැගින් ගණන් බලනු ලබන මුදලක් තැම්පත් කළ යුතු වේ. මෙම තැන්පතුව ආපසු නොගෙවනු ලබන නමුත් තේරුණු තැනැත්තා විසින් ගෙවිය යුතු ගැණුම් මුදලට එය හිලව් කරනු ලැබේ.

8. ඉහත සඳහන් ඉඩම් කච්චේරිය පිළිබඳ විස්තර පහත දැක්වෙන තැනැත්තන්ගෙන් ඔවුන්ගේ නම් ඉදිරියෙන් දක්වා ඇති ස්ථානවල දී ලබාගත හැක.

1. බී. එම්. එන්. ආර්. සම්පත් මයා. සහකාර ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ගල්ගමුව.
2. ඩී. එම්. එස්. කේ. දිසානායක මිය. ක්ෂේත්‍ර උපදේශක, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ගල්ගමුව.
3. ජේ. එම්. විජේදාස මයා. ග්‍රාම නිලධාරි, ග්‍රාම නිලධාරි කාර්යාලය, අංක 60, මහගල්ගමුව පළාත.

ඉඩම් කොමසාරිස් (වයඹ).

2010 මැයි මස 04 වැනි දින.

(ඉල්ලුම්පත්‍රයේ හා ආදර්ශ ආකෘතිය පහතින් දක්වා ඇත.)

*ආදර්ශ ආකෘති පත්‍රය*

**පදිංචිවීම/වගාකිරීම සඳහා ඉඩම් ඉල්ලීමේ ඉල්ලුම් පත්‍රය**

1. ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම :—————.
2. ලිපිනය :—————.
3. උපන් දිනය :—————. වයස :—————.
4. රැකියාව :—————.
5. භාර්යාවගේ/පුරුෂයාගේ නම :—————.
6. රැකියාව :—————.
7. පවුලේ සංඛ්‍යාව :—————. පවුලේ වාර්ෂික ආදායම :—————.
8. ඉඩම් ඉල්ලන්නේ පදිංචියට ද :—————.වගාවට ද :—————. ඉහත කරුණු දෙකටම ද :—————.

(i) නිවේදනයේ සඳහන් ඉඩම් අතුරෙන් ඔබ ඉඩම් ඉල්ලන්නේ කුමන ග්‍රාම නිලධාරි වසමෙන් ද :—————;
(ii) එම වසමේ ස්ථිර පදිංචිකරුවෙක් ද :—————;
(iii) එසේ නම් පදිංචි කාලය :—————;
(iv) එසේ නොවේ නම් ඔබ පදිංචි ග්‍රා. නි. වසම :—————;
(v) පදිංචි කාලය :—————.

9. තමා සතු ඉඩම් පිළිබඳ විස්තර :

(i) පදිංචි නිවසේ අයිතිකරු :—————;
(ii) තමාට අයත් ගොඩ ඉඩම් :—————;
(iii) තමාට අයත් කුඹුරු ඉඩම් :—————;

10. රණවිරු පවුලක සාමාජිකයෙක් නම් පහත විස්තර සපයන්න :

(i) මීට පෙර රණවිරු ගම්මානයක ඉඩම් ලැබී තිබේ ද :—————;
(ii) ඒ කිනම් ස්ථානයකින් ද :—————;
(iii) රණවිරු පවුලකට සම්බන්ධ නම් ඉල්ලුම්කරු තමා ද :————;
(iv) වෙනත් අයෙක් නම් ඥාතීත්වය :—————;
(v) ඉල්ලුම්කරු නම් *(අ)* සේවයේ සිටී ද :—————;

*(ආ)* ආබාධිත ද :—————;

*(ඇ)* වැන්දඹු ද :—————.

ඉහත සඳහන් තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට නිවැරදි හා සත්‍ය බව සහතික කරමි. වැරදි හා අසත්‍ය තොරතුරු සපයා ඇති බව මා ඉඩම් ලාභියෙකු ලෙස තෝරා ගැනීමෙන් පසුව වුව ද හෙළි වුවහොත් මා නුසුදුස්සෙකු සේ සැලකීමට හේතු වන බව ද දනිමි.

—————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :—————.

05-498

# තනතුරු - ඇබෑර්තු

## බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් ක්‍රීඩා අමාත්‍යාංශයේ ක්‍රීඩා නිලධාරි III ශ්‍රේණිය සඳහා ගැනීම - 2010

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් ක්‍රීඩා අමාත්‍යාංශයේ ක්‍රීඩා නිලධාරි III ශ්‍රේණියේ තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා පහත සුදුසුකම්ලත් ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශ්වයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ.

02. 02.1 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 (iv) අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය : රු. 13,120-145x10-170x11-240x10-320x10 - රු. 22,040 වේ. (MN - 1 - 2006A)

02.2 *වයස් සීමාව.-* අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවුරුදු 18 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය. දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය ස්ථිර සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමා අදාළ නොවේ. ඔවුන් සිය අයදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

02.3 *සේවා කොන්දේසි.-* අනුමත සේවා ව්‍යවස්ථාව අනුව සේවා කොන්දේසි තීරණය වේ. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

03. *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් ඃ-*

*(අ)* දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල භාෂාව/දෙමළ භාෂාව හා ගණිතය ඇතුළු විෂයයන් 3 ක් සඳහා සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයකින් අ.පො.ස (සා.පෙළ) විභාගය සමත් විය යුතුය. ඉන් විෂයයන් පහක් එකවර සමත් විය යුතුය ;

*සහ*

ජාතික ක්‍රීඩා විද්‍යායතනය මගින් පවත්වනු ලබන මාස 06 ක පාඨමාලාවක් සාර්ථක ලෙස සම්පූර්ණ කළ බවට සහතික පත්‍රයක් ලබා තිබීම ;

*හෝ*

යුධ/නාවික/ගුවන් හමුදා අභ්‍යාස පාසලක මාස 06 ට වඩා නොඅඩු ක්‍රීඩා හා ශාරීරික අධ්‍යාපනය පිළිබඳ පිළිගත් පාඨමාලාවක් සාර්ථක ලෙස සම්පූර්ණ කළ බවට සහතික පත්‍රයක් ලබා තිබීම ;

*හෝ*

ක්‍රීඩා පනත යටතේ පිළිගත් ක්‍රීඩාවක ජාතික කණ්ඩායමක සාමාජිකයෙක්ව ජාත්‍යන්තර තරගයකට සහභාගි වී සහතික පත්‍රයක් ලබා තිබීම ;

*හෝ*

රේඛීය ක්‍රීඩා අමාත්‍යාංශය විසින් පවත්වනු ලබන ජාතික මහා ක්‍රීඩා උළෙලක දිස්ත්‍රික් මට්ටමේ 1,2 ස්ථාන සඳහා සහතික පත්‍රයක් ලබා තිබීම, ජාතික ක්‍රීඩා සංගම් (ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනත යටතේ පිහිටුවන ලද) විසින් පවත්වනු ලබන ජාතික මට්ටමේ තරගවල 1,2,3 යන ස්ථාන ලබා තිබීම.

04. *අපේක්ෂකයින්.-*

04.1 ශ්‍රී ලංකා පුරවැසියන් විය යුතුය ;

04.2 මනා චරිතයකින් යුක්ත විය යුතුය ;

04.3 මෙම තනතුරේ රාජකාරී ඉටු කිරීම සඳහා කායික හා මානසික වශයෙන් සුදුසු විය යුතුය ;

04.4 අයදුම්කරුවන් බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිය සනාථ කළ යුතු අතර, අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය වන 2010.06.15 දිනට බස්නාහිර පළාත තුළ අවම වශයෙන් අවු. 03 ක කාලයක් ස්ථිර පදිංචිය ඇති අයදුම්කරුවන් විය යුතුය. මේ සඳහා ස්ථිර පදිංචිය පිළිබඳ ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබා ගත් සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.

05. *බඳවාගැනීමේ ක්‍රමය ඃ-* රජයේ ගැසට් පත්‍රය මගින් හෝ ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීමක් මගින් අයදුම්පත් කැඳවා ලිඛිත විභාගයක් පවත්වා කුසලතා අනුපිළිවෙළ මත පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ. සමාන ලකුණු ලබා ඇති අපේක්ෂකයින් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් ඇත්නම් සුදුස්සකු තෝරා ගැනීමේ අවසාන තීරණය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

06. *ලිඛිත පරීක්ෂණයේ විෂයය නිර්දේශය.-*

මෙම පරීක්ෂණය ප්‍රශ්න පත්‍ර 02 කින් සමන්විතය ඃ

1. සාමාන්‍ය දැනීම - කාලය පැය 01 1/2, ලකුණු 100
2. ක්‍රීඩා නීති හා ක්‍රීඩා පරිපාලනය - කාලය පැය 1 1/2 යි, ලකුණු 100

සුදුසුකම් ලැබීම සඳහා අවම වශයෙන් එක් එක් ප්‍රශ්න පත්‍රයකට ලකුණු 40% ක් බැගින් ලබා ගත යුතුය.

01. *සාමාන්‍ය දැනීම.-* ඔලිම්පික්, ආසියාතික, දකුණු ආසියාතික හා ජාතික තරගවල දී ජයග්‍රාහකයන්, දක්ෂතාවයන් හා ඉසව් පිළිබඳ දැනුම හා විශේෂයෙන් අවසාන වරට පැවැත්වූ පළමු තරගවල දැනුම, ශ්‍රී ලංකාවේ හා ජාත්‍යන්තර ක්‍රීඩාවන් පිළිබඳ සාමාන්‍ය දැනුම.

02. *ක්‍රීඩා නීති හා පරිපාලනය.-*

*ක්‍රීඩා නීති.-* මලල ක්‍රීඩා (ජවන හා පිටිය), වොලිබෝල්, නෙට්බෝල්, පාපන්දු, එල්ලේ, ක්‍රිකට් වැනි දැනට ක්ෂේත්‍රයේ පවත්නා ක්‍රීඩාවන්හි මූලික නීති රීති හා අදාළ ක්‍රීඩාවන් සඳහා භාවිතා කරනු ලබන ශිල්පීය ක්‍රම පිළිබඳ දැනුම.

*ක්‍රීඩා පරිපාලනය.-* තරග විනිශ්චය හා ක්‍රීඩා ක්ෂේත්‍රය පිළිබඳ අවබෝධය - ඒ අනුව තීරණ ගැනීම, ක්‍රීඩා ක්ෂේත්‍රයේ සංකීර්ණ අවස්ථා, සිද්ධි අධ්‍යයනය මගින් ඉදිරිපත් කර ඒ අවස්ථාවට මුහුණු දීමේ හැකියාව සහ ගැටළු විසඳීමේ හැකියාව මැන බැලීම.

07. දැනට වාර්තා වී ඇති පුරප්පාඩු හා ඉදිරියේ දි ඇතිවන පුරප්පාඩු, යථොක්ත විභාගයෙන් සමත් අයවළුන් සිටීනම් එම අයගෙන් පිරවීම පිළිබඳ අවසාන තීරණය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

08. විභාග ගාස්තු වශයෙන් රු. 350 ක් පළාත් සභා ආදායම් ශීර්ෂ 20-03-90-01 ට බැරවන පරිදි ළඟම පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගෙවා ලබා ගන්නා ලද බ. ප. 1 ලදුපත අයදුම්පතට අමුණා එවිය යුතුය. එසේ මුදල් ගෙවා ලබා ගත් ලදුපත් හැර වෙනත් ආයතනවලට ගෙවා ලබා ගත් ලදුපත් හෝ මුදල් ඇණවුම් භාරගනු නොලබන අතර, කුමන හේතුවක් නිසා හෝ ගෙවූ විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන බව සැලකිය යුතුය.

09. *ඉල්ලුම් කළ යුතු පිළිවෙල.-*

09.1 මෙම නිවේදනයේ අග ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව ඒ 4 ප්‍රමාණයේ (සෙ. මී. 21 x 29) කඩදාසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත සකස් කර ගත යුතුය. සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2010.06.15 දිනට පෙර ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.), නිදහස් චතුරස්‍රය, කොළඹ 07 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ, "ක්‍රීඩා නිලධාරි III ශ්‍රේණියට බඳවා ගැනීම - 2010" යනුවෙන් සඳහන් කළ යුතුය. (දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය ස්ථිර සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් සේවා ප්‍රධානියා මගින් එවිය යුතුය.) ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

10. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2010.06.15 වේ.

11. නිවේදනයේ ඇති සුදුසුකම්වලට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක්

නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා අදාළ නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවක දී අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ පත්වීම ලැබීමට ඇති හිමිකම අවලංගු කරනු ලැබේ. සෑම අයදුම්කරුවෙක්ම තනතුරට අදාළ සියලු සුදුසුකම් 2010.06.15 දිනට හෝ එදිනට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්යය වේ.

12. *අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය.*- තමා පෙනී සිටින විෂයය සඳහා විභාග ශාලා භාර නිලධාරියාට අයදුම්කරු තම අනන්‍යතාවය ඒත්තු ගැන්විය යුතුය. මේ සඳහා පහත සඳහන් ලියවිලිවලින් එකක් පිළිගනු ලැබේ.

1. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත.
2. වලංගු විදේශ ගමන් බලපත්‍රයක්

*සටහන.*- විභාග ශාලාවේදී තම අනන්‍යතාවය තහවුරු කිරීමට අපේක්ෂකයින් අපොහොසත් වුවහොත් ඔවුන් නුසුදුස්සන් ලෙස සලකනු ලැබේ.

13. කිසියම් අපේක්ෂකයකුට සිය ප්‍රවේශ පත්‍රය විභාගයට යටත් පිරිසෙයින් දින 07 කට පෙර නොලැබුණහොත් ඒ බව වහාම ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.), නිදහස් චතුරශ්‍රය, කොළඹ 07. යන ලිපිනයට දැන්විය යුතුයි. එසේ දීමේදී පහත විස්තර ඉදිරිපත් කළ යුතුයි :

(අ) විභාගයේ නම :—————;
(ආ) අපේක්ෂකයාගේ සම්පූර්ණ නම :—————;
(ඇ) ලිපිනය :—————;
(ඈ) අයදුම්පත්‍රය යොමු කළ ලිපිනය, ලියාපදිංචි තැපැල් අංකය හා දිනය :—————.

14. යම් අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව පත්වීම ලැබීමට පෙර ඕනෑම අවස්ථාවක අනාවරණය වුවහොත් අපේක්ෂකත්වය අවලංගු කෙරෙනු ඇත. පත්වීම ලැබීමෙන් පසු හෝ සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෝ නිරවද්‍ය තොරතුරු ඕනෑකමින් යටපත් කර ඇති බව හෝ අනාවරණය වුවහොත් සේවයෙන් පහ කෙරෙනු ඇත.

15. අයදුම්පත් කැඳවීමේ නිවේදනයට අදාළ කරුණු හෝ එම නිවේදනයෙන් අනාවරණය නොවන වෙනත් කරුණු සම්බන්ධයෙන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වේ.

වී. රාජපක්ෂ,
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

2010 මැයි මස 06 වැනි දින,

**ආදර්ශ අයදුම්පත්‍රය**

*බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් ක්‍රීඩා අමාත්‍යාංශයේ ක්‍රීඩා නිලධාරි III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ තරග විභාගය - 2010*

විභාග අංකය : [ ]

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

01. (අ) මුලකුරු සමග නම :—————.
(ආ) සම්පූර්ණ නම :—————.
(ඇ) ජාතික හැඳුනුම්පත් අංකය : [ | | | | | | | | | ]

02. ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :—————.

03. (i) ස්ථිර ලිපිනය :—————.
(ii) ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය (අදාළ කොටුව තුළ "✓" ලකුණ යොදන්න)

කොළඹ : [ ] ගම්පහ : [ ] කළුතර : [ ]

(iii) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන 2010.06.15 දිනට අදාළ දිස්ත්‍රික්කයේ ස්ථිර පදිංචිය :

අවු :—————; මාස :—————; දින :—————.

(iv) දුරකථන අංකය - පෞද්ගලික :—————. රාජකාරි :—————.

04. ස්ත්‍රී/පුරුෂ භාවය (අදාළ කොටුව තුළ "✓" ලකුණ යොදන්න) :

ස්ත්‍රී : [ ] පුරුෂ : [ ]

05. විභාගයට පෙනී සිටින මාධ්‍යය - (අදාළ කොටුව තුළ "✓" ලකුණ යොදන්න)

සිංහල : [ ] දෙමළ : [ ] ඉංග්‍රීසි : [ ]

06. උපන් දිනය :

වර්ෂය :—————. මාසය:—————. දිනය :—————.
(i) අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වන 2010.06.15 දිනට වයස
අවුරුදු :—————. මාස :—————. දින :—————.

(ii) ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන්නේ උපතින්ද/ලියාපදිංචි වීමෙන් ද?
:—————.

07. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් : (අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ 3 යටතේ,)

(අ) (i) අ.පො.ස. (සා.පෙළ) විභාගයට පෙනී සිටි වර්ෂය
(ii) විභාග අංකය :—————.
(iii)

| විෂයය | *ලබා ඇති සාමාර්ථය* | විෂයය | *ලබා ඇති සාමාර්ථය* |
|---|---|---|---|
| ................ | ................ | ................ | ................ |
| ................ | ................ | ................ | ................ |
| ................ | ................ | ................ | ................ |
| ................ | ................ | ................ | ................ |

(ආ) නිවේදනයට අදාළව සපුරා ඇති සුදුසුකම්- (නිවේදනයේ අංක 2 යටතේ හදාරා ඇති පාඨමාලා හෝ තරගවලින් ලබා ඇති ස්ථාන පිළිබඳව පැහැදිලිව සඳහන් කරන්න) :—————.

(මෙම තොරතුරු පැහැදිලිව හා නිවැරදිව සඳහන් කර නොමැති නම් අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.)

08. විභාග ගාස්තු ගෙවූ ලදුපත් අංකය :—————.
දිනය :—————.

ලදුපත් ලබා ගත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :—————.

| ලදුපත මෙම කොටුව තුළ නොගැලවෙන සේ අලවන්න |
|---|

09. .................................................................................. වන මා විසින් මෙම අයදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මා විසින් සපයා ඇති තොරතුරු සාවද්‍ය යැයි සොයා ගනු ලැබුවහොත් බස්නාහිර පළාත් ක්‍රීඩා අමාත්‍යාංශයේ ක්‍රීඩා නිලධාරි III ශ්‍රේණියේ තනතුරට පත් කිරීම සඳහා වූ මාගේ හිමිකම නොසලකා හරිනු ලැබීමට ද මට විරුද්ධව විනයානුකූල කටයුතු කරනු ලැබීමට ද හැකි බව මම හොඳාකාරවම දනිමි.

—————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————.

අයදුම්කරුගේ අත්සන සහතික කිරීම.-
(අනවශ්‍ය වචන කපා හරින්න)

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ............................................ මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු/ඇය ...................................... දින මා ඉදිරිපිට දී ඔහු/ඇය ගේ අත්සන තැබූ බවත්, සහතික කරමි.

සහතික කරන අයගේ නම :—————;
අත්සන :—————;
තනතුර හා නිල මුද්‍රාව :—————.

(මෙම සහතිකය රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු/සමාදාන විනිශ්චයකාරවරයෙකු දිවුරුම් කොමසාරිස්වරයෙකු/නීතිඥයෙකු/යුධ හමුදාවේ හෝ ගුවන් හමුදාවේ අධිකාරී බලය ලත් නිලධාරියෙකු හෝ වර්ෂයකට රු. 237,060/- නොඅඩු ඒකාබද්ධ වැටුපක් ලබන ස්ථිර තනතුරක් දරන රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නිලධාරියෙකු විසින් සහතික කළ යුතුයි.)

රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය.-

(අනවශ්‍ය වචන කපා හරින්න)

....................................................... මයා/මිය/මෙනවිය දැනට .................................................. අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ........................................... වශයෙන් ස්ථිර සේවයේ යෙදී සිටින බවත්, ඔහුගේ/ඇයගේ සේවය සතුටුදායක බවත් ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කර හෝ සානුකම්පිත විකල්පයක් වශයෙන් අකාර්යක්ෂමතාවය මත විශ්‍රාම ගන්වා ඇති/නැති බවත්, තනතුර අතහැර ගිය අයෙකු සේ සලකා ඇති/නැති බවත්, ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවට සහතික කරන අතර, මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා ඔහු/ඇය තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරින් නිදහස් කළ හැකිය/නොහැකිය.

—————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව තබන්න)

දිනය :—————.

05-572

## බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශයේ ග්‍රාම සංවර්ධන නිලධාරි II පංතියට බඳවා ගැනීම - 2010

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශයේ ග්‍රාම සංවර්ධන නිලධාරි II පංතියේ තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා පහත සුදුසුකම්ලත් ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශ්වයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ:

02. 2.1 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 (iv) අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය රු. 16,720-10x320-11x365-15x450- රු. 306,850 වේ. (MN - 5 - 2006A)

02.2 *වයස් සීමාව.-* අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවුරුදු 18 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය. දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය ස්ථිර සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමා අදාළ නොවේ. ඔවුන් සිය අයදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

02.3 *සේවා කොන්දේසි.-* අනුමත සේවා ව්‍යවස්ථාව අනුව සේවා කොන්දේසි තීරණය වේ. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

03.3. *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :-*

3.1.1 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් ලබා තිබීම.

*සහ*

දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල භාෂාව/දෙමළ භාෂාව, ගණිතය ඇතුළුව යටත් පිරිසෙයින් විෂයයන් 3 කට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 6 කින් අ.පො.ස. (සා/පෙළ) විභාගය සමත් වී තිබිය යුතුය. ඉන් විෂයයන් 5 ක් එකවර සමත් වී තිබිය යුතුය.

*හෝ*

3.1.2 අ.පො.ස (උ/පෙළ) විභාගයේ එකම අවස්ථාවකදී විෂයයන් හතරකින් (නව නිර්දේශය නම් විෂයයන් තුනකින්) සාමාර්ථ ලබා තිබීම හා ශ්‍රී ලංකා සමාජ සේවා විද්‍යාලයේ සමාජ වැඩ පිළිබඳ දෑ අවුරුදු ඩිප්ලෝමා සහතිකය හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක ප්‍රජා සංවර්ධනය පිළිබඳ ඩිප්ලෝමා සහතිකය හෝ කෘෂිකර්ම අභ්‍යාස විද්‍යාලයේ ඩිප්ලෝමා සහතිකය හෝ ලබා තිබීම.

*සහ*

දෙවරකින් නොවැඩි වාර ගණනක දී සිංහල භාෂාව/දෙමළ භාෂාව, ගණිතය ඇතුළුව යටත් පිරිසෙයින් විෂයයන් 3 කට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 6 කින් අ.පො.ස (සා/පෙළ) විභාගය සමත් වී තිබිය යුතුය. ඉන් විෂයයන් 5 ක් එකවර සමත්වී තිබිය යුතුය.

04. *අපේක්ෂකයින්.-*

04.1 ශ්‍රී ලංකා පුරවැසියන් විය යුතුය.

04.2 මනා චරිතයකින් යුක්ත විය යුතුය.

04.3 මෙම තනතුරේ රාජකාරී ඉටු කිරීම සඳහා කායික හා මානසික වශයෙන් සුදුසු විය යුතුය.

04.4 අයදුම්කරුවන් බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිය සනාථ කළ යුතු අතර, අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය වන 2010.06.15 දිනට බස්නාහිර පළාත තුළ අවම වශයෙන් අවු. 03 ක කාලයක් ස්ථිර පදිංචිය ඇති අයදුම්කරුවන් විය යුතුය. මේ සඳහා ස්ථිර පදිංචිය පිළිබඳ ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබා ගත් සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.

05. *බඳවාගැනීමේ ක්‍රමය* :- රජයේ ගැසට් පත්‍රයේ හෝ ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීමක් මගින් අයදුම්පත් කැඳවා ලිඛිත විභාගයක් පවත්වා කුසලතා අනුපිළිවෙළ මත පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ. සමාන ලකුණු ලබා ඇති අපේක්ෂකයින් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් ඇත්නම් සුදුස්සකු තෝරා ගැනීමේ අවසාන තීරණය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

06. *ලිඛිත පරීක්ෂණයේ විෂයය නිර්දේශය*.-

මෙම පරීක්ෂණය ප්‍රශ්න පත්‍ර 02 කින් සමන්විතය.

1. අභියෝග්‍යතා පරීක්ෂණය - කාලය පැය 01, ලකුණු 100
2. සාමාන්‍ය දැනීම - කාලය පැය 1යි, ලකුණු 100.

සුදුසුකම් ලැබීම සඳහා අවම වශයෙන් එක් එක් ප්‍රශ්න පත්‍රයකට ලකුණු 40% ක් බැගින් ලබා ගත යුතුය.

*අභියෝග්‍යතා පරීක්ෂණය*.- අපේක්ෂකයාගේ භාෂා හැකියාව, තර්කන ශක්තිය හා ගණිතමය හැකියාව පරීක්ෂා කිරීම සඳහා සකස් වූවකි.

*සාමාන්‍ය දැනීම*.- මෙම ප්‍රශ්න පත්‍රය, ආර්ථික, දේශපාලන, අධ්‍යාපන, සමාජයීය, සංස්කෘතික, විද්‍යාත්මක හා ක්‍රීඩා ක්ෂේත්‍රයන්හි දේශීය හා විදේශීය වශයෙන් වැදගත් වන්නා වූ කාලීන සිද්ධීන් පිළිබඳ අපේක්ෂකයාගේ දැනුම මැනීම සඳහා සකස් කෙරෙන ප්‍රශ්න වලින් සමන්විත ප්‍රශ්න පත්‍රයකි.

07. දැනට වාර්තා වී ඇති පුරප්පාඩු හා ඉදිරියේදී ඇතිවන පුරප්පාඩු, යථෝක්ත විභාගයෙන් සමත් අයවළුන් සිටීනම් එම අයගෙන් පිරවීම පිළිබඳ අවසාන තීරණය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

08. විභාග ගාස්තු වශයෙන් රු. 350/- ක් පළාත් සභා ආදායම් ශීර්ෂ 20-03-90-01 ට බැරවන පරිදි ළඟම පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගෙවා ලබා ගන්නා ලද බ. ප. 1 ලදුපත අයදුම්පතට අමුණා එවිය යුතුය. එසේ මුදල් ගෙවා ලබා ගත් ලදුපත් හැර වෙනත් ආයතනවලට ගෙවා ලබා ගත් ලදුපත් හෝ මුදල් ඇණවුම් භාරගනු නොලබන අතර, කුමන හේතුවක් නිසා හෝ ගෙවූ විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන බව සැලකිය යුතුය.

09. *ඉල්ලුම් කළ යුතු පිළිවෙල*.-

09.1 මෙම නිවේදනයේ අග ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව ඒ 4 ප්‍රමාණයේ (සෙ. මී. 21 x 29) කඩදාසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත සකස් කර ගත යුතුය. සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2010.06.15 දිනට පෙර "ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.), නිදහස් චතුරස්‍රය, කොළඹ 07" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ, "ග්‍රාම සංවර්ධන නිලධාරී II පන්තියට බඳවා ගැනීම - 2010" යනුවෙන් සඳහන් කළ යුතුය. (දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය ස්ථිර සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් සේවා ප්‍රධානියා මගින් එවිය යුතුය.) ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

10. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2010.06.15 වේ.

11. නිවේදනයේ ඇති සුදුසුකම්වලට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා අදාළ නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවක දී අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ පත්වීම ලැබීමට ඇති හිමිකම අවලංගු කරනු ලැබේ. සෑම අයදුම්කරුවෙක්ම තනතුරට අදාළ සියලු සුදුසුකම් 2010.06.15 දිනට හෝ එදිනට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්යය වේ.

12. *අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය*.- තමා පෙනී සිටින විෂයය සඳහා විභාග ශාලා භාර නිලධාරියාට අයදුම්කරු තම අනන්‍යතාවය ඒත්තු ගැන්විය යුතුය. මේ සඳහා පහත සඳහන් ලියවිලිවලින් එකක් පිළිගනු ලැබේ.

1. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත.
2. වලංගු විදේශ ගමන් බලපත්‍රයක්

*සටහන*.- විභාග ශාලාවේදී තම අනන්‍යතාවය තහවුරු කිරීමට අපේක්ෂකයින් අපොහොසත් වුවහොත් ඔවුන් නුසුදුස්සන් ලෙස සලකනු ලැබේ.

13. කිසියම් අපේක්ෂකයකුට සිය ප්‍රවේශ පත්‍රය විභාගයට යටත් පිරිසෙයින් දින 07 කට පෙර නොලැබුණහොත් ඒ බව වහාම ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.), නිදහස් චතුරශ්‍රය, කොළඹ 07 යන ලිපිනයට දැන්විය යුතුයි. එසේ දීමේදී පහත විස්තර ඉදිරිපත් කළ යුතුයි.

*(අ)* විභාගයේ නම :—————.
*(ආ)* අපේක්ෂකයාගේ සම්පූර්ණ නම :—————.
*(ඇ)* ලිපිනය :—————.
*(ඈ)* අයදුම්පත්‍රය යොමු කළ ලිපිනය, ලියාපදිංචි තැපැල් අංකය හා දිනය :—————.

14. යම් අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව පත්වීම ලැබීමට පෙර ඕනෑම අවස්ථාවක අනාවරණය වුවහොත් අපේක්ෂකත්වය අවලංගු කෙරෙනු ඇත. පත්වීම ලැබීමෙන් පසු හෝ සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෝ නිරවද්‍ය තොරතුරු ඕනෑකමින් යටපත් කර ඇති බව හෝ අනාවරණය වුවහොත් සේවයෙන් පහ කෙරෙනු ඇත.

15. අයදුම්පත් කැඳවීමේ නිවේදනයට අදාළ කරුණු හෝ එම නිවේදනයෙන් අනාවරණය නොවන වෙනත් කරුණු සම්බන්ධයෙන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වේ.

වී. රාජපක්ෂ,
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

2010 මැයි මස 06 වැනි දින,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,
බස්නාහිර පළාත් සභා සංකීර්ණය,
කොළඹ.

*ආදර්ශ අයදුම්පත්‍රය*

*බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශයේ ග්‍රාම සංවර්ධන නිලධාරී II පන්තියට බඳවා ගැනීම- 2010*

විභාග අංකය : [ ]

*(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)*

01. *(අ)* මුලකුරු සමඟ නම :—————.

*(ආ)* සම්පූර්ණ නම :—————.

*(ඇ)* ජාතික හැඳුනුම්පත් අංකය : [ | | | | | | | | | ]

02. ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :—————.

03. (i) ස්ථිර ලිපිනය :—————.

(ii) ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය (අදාළ කොටුව තුළ "✓" ලකුණ යොදන්න) :

කොළඹ [ ] ගම්පහ [ ] කළුතර [ ]

(iii) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන 2010.06.15 දිනට අදාළ දිස්ත්‍රික්කයේ ස්ථිර පදිංචිය :

අවුරුදු :—————. මාස :—————. දින :—————.

(iv) දුරකථන අංකය : පෞද්ගලික :————. රාජකාරී :————.

04. ස්ත්‍රී/පුරුෂ භාවය (අදාළ කොටුව තුළ "✓" ලකුණ යොදන්න) :—————.

ස්ත්‍රී : [ ] පුරුෂ : [ ]

05. විභාගයට පෙනී සිටින මාධ්‍යය - (අදාළ කොටුව තුළ "✓" ලකුණ යොදන්න) :–

සිංහල [ ] දෙමළ [ ] ඉංග්‍රීසි [ ]

06. උපන් දිනය : වර්ෂය :————. මාසය:————. දිනය :—————.

(i) අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වන 2010.06.15 දිනට වයස :

අවුරුදු :—————. මාස :—————. දින :—————.

(ii) ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන්නේ උපතින් ද/ලියාපදිංචි වීමෙන් ද? :—————.

07. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් : අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ 3 යටතේ,

(අ) (i) අ.පො.ස. (සා.පෙළ) විභාගය

පළමුවර - වර්ෂය :————. දෙවනවර - වර්ෂය :————.

විභාග අංකය :—————. විභාග අංකය :—————.

| විෂයය | *ලබා ඇති සාමාර්ථය* | විෂයය | *ලබා ඇති සාමාර්ථය* |
|---|---|---|---|
| 1. ............... | ............... | 1. ............... | ............... |
| 2. ............... | ............... | 2. ............... | ............... |
| 3. ............... | ............... | 3. ............... | ............... |
| 4. ............... | ............... | 4. ............... | ............... |
| 5. ............... | ............... | 5. ............... | ............... |
| 6. ............... | ............... | 6. ............... | ............... |
| 7. ............... | ............... | 7. ............... | ............... |
| 8. ............... | ............... | 8. ............... | ............... |

(ආ) (i) අ.පො.ස. (උ.පෙළ) විභාගයට පෙනී සිටි වර්ෂය :————.

(ii) විභාග අංකය :—————.

(iii)

| *විෂයය* | *ලබා ඇති සාමාර්ථය* |
|---|---|
| 1. ........................................ | ........................... |
| 2. ........................................ | ........................... |
| 3. ........................................ | ........................... |
| 4. ........................................ | ........................... |

ඇ. උපාධියක් ලබා ඇත්නම් ඒ පිළිබඳ විස්තර :

(i) ලබා ඇති උපාධිය :—————.

(ii) උපාධිය වලංගු දිනය :—————.

ඇ. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ 3.1.2 අනුව ලබා ඇති ඩිප්ලෝමා සහතිකය පිළිබඳ විස්තර :

(i) ලබා ඇති ඩිප්ලෝමාව :—————.

(ii) එම සහතිකය වලංගු දිනය :—————.

(මෙම තොරතුරු පැහැදිලිව හා නිවැරදිව සඳහන් කර නොමැති නම් අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.)

08. විභාග ගාස්තු ගෙවූ ලදුපත් අංකය :—————.

දිනය :—————.

ලදුපත් ලබා ගත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :—————.

| ලදුපත මෙම කොටුව තුළ නොගැලවෙන සේ අලවන්න |
|---|

09. .............................................................................. වන මා විසින් මෙම අයදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මා විසින් සපයා ඇති තොරතුරු සාවද්‍ය යැයි සොයා ගනු ලැබුවහොත් බස්නාහිර පළාත් ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශයේ ග්‍රාම සංවර්ධන නිලධාරී II පංතියේ තනතුරට පත් කිරීම සඳහා වූ මාගේ හිමිකම නොසලකා හරිනු

ලැබීමට ද මට විරුද්ධව විනයානුකූලව කටයුතු කරනු ලැබීමට ද හැකි බව මම හොඳාකාරවම දනිමි.

__________,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————.

අයදුම්කරුගේ අත්සන සහතික කිරීම.-
(අනවශ්‍ය වචන කපා හරින්න)

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ........................................ මයා./මිය./මෙනවිය මා පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු/ඇය ...................................... දින මා ඉදිරිපිට දී ඔහු/ඇය ගේ අත්සන තැබූ බවත්, සහතික කරමි.

සහතික කරන අයගේ නම :——————.
අත්සන :——————.
තනතුර හා නිල මුද්‍රාව :——————.

(මෙම සහතිකය රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු/සමාදාන විනිශ්චයකාරවරයෙකු දිවුරුම් කොමසාරිස්වරයෙකු/නීතිඥයෙකු/යුධ හමුදාවේ හෝ ගුවන් හමුදාවේ අධිකාරි බලය ලත් නිලධාරියෙකු හෝ වර්ෂයකට රු. 2,37,060 නොඅඩු ඒකාබද්ධ වැටුපක් ලබන ස්ථිර තනතුරක් දරන රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නිලධාරියෙකු විසින් සහතික කළ යුතුයි.).

රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය.-

*(අනවශ්‍ය වචන කපා හරින්න)*

........................................................ මයා./මිය./මෙනවිය දැනට ..................................................... අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ........................................... වශයෙන් ස්ථිර සේවයේ යෙදී සිටින බවත්, ඔහුගේ/ඇයගේ සේවය සතුටුදායක බවත් ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කර හෝ සානුකම්පිත විකල්පයක් වශයෙන් අකාර්යක්ෂමතාවය මත විශ්‍රාම ගන්වා ඇති/නැති බවත්, තනතුර අතහැර ගිය අයෙකු සේ සලකා ඇති/නැති බවත්, ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවට සහතික කරන අතර, මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා ඔහු/ඇය තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරින් නිදහස් කළ හැකිය/නොහැකිය.

___________,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව තබන්න)

දිනය :——————.

05-556

---

**බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ සමුපකාර සංවර්ධන නිලධාරී III පංතියට බඳවා ගැනීම - 2010

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ සමුපකාර සංවර්ධන නිලධාරි III පන්තියේ තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා පහත සුදුසුකම්ලත් ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශ්වයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ.

02. 02.1 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 (iv) අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය රු. 15,005 - 4 x 180 - 6 x 240 - 11 x 320 - 20 x 360 - රු. 27,885 වේ. (MN - 3 - 2006).

02.2 *වයස් සීමාව.-* අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවුරුදු 18 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය. දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය ස්ථිර සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමා අදාළ නොවේ. ඔවුන් සිය අයදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

02.3 *සේවා කොන්දේසි.-* අනුමත සේවා ව්‍යවස්ථාව අනුව සේවා කොන්දේසි තීරණය වේ. මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය.

03. *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :-*

*(අ)* දෙවරකට නොවැඩි වාර ගණනක දී පැරණි නිර්දේශය අනුව අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් හෝ උසස් පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් විෂයයන් 04කින් සමත්වීම හෝ නව විෂය නිර්දේශය යටතේ අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් එක්වර විෂයයන් තුනකින් සමත්ව තිබීම හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) පැරණි නිර්දේශය යටතේ දෙවරක දී විෂයයන් 04 ක් සමත් වූවන් යටත් පිරිසෙයින් එක් වරක දී විෂයයන් 03 ක් සමත් වී තිබිය යුතුය ;

*හෝ*

ගණිතය සහ සිංහල/දෙමළ ඇතුළුව අවම වශයෙන් විෂයයන් 03 කට සම්මාන සහිතව අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය එකවර විෂයයන් 06 කින් සමත් වීම ;

*සහ*

පොල්ගොල්ල ජාතික සමුපකාර සංවර්ධන ආයතනය මගින් ප්‍රදානය කරනු ලබන සමුපකාර සේවක සහතිකය (උසස් පෙළ).

04. *අපේක්ෂකයින්.-*

04.1 ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.

04.2 මනා චරිතයකින් යුක්ත විය යුතුය.

04.3 මෙම තනතුරේ රාජකාරී ඉටු කිරීම සඳහා කායික හා මානසික වශයෙන් සුදුසු විය යුතුය.

04.4 අයදුම්කරුවන් බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිය සනාථ කළ යුතු අතර, අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය වන 2010.06.14 දිනට බස්නාහිර පළාත තුළ අවම වශයෙන් අවු. 03 ක කාලයක් ස්ථිර පදිංචිය ඇති අයදුම්කරුවන් විය යුතුය. මේ සඳහා ස්ථිර පදිංචිය පිළිබඳ ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබා ගත් සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.

05. *බඳවාගැනීමේ ක්‍රමය :-* රජයේ ගැසට් පත්‍රයේ හෝ ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීමක් පළ කිරීම මගින් අයදුම්පත් කැඳවා මූලික සුදුසුකම් ඇති අය ලිඛිත තරග විභාගයකට භාජනය කිරීමෙන් අනතුරුව කුසලතාවය මත රා. ප. ච. 15/90 විධිවිධාන අනුව III වැනි පන්තියට බඳවා ගනු ලැබේ. සමාන ලකුණු ලබා ඇති අපේක්ෂකයින් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් ඇත්නම් සුදුස්සකු තෝරා ගැනීමේ අවසාන තීරණය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

06. *ලිඛිත පරීක්ෂණයේ විෂයය නිර්දේශය.-*

මෙම පරීක්ෂණය ප්‍රශ්න පත්‍ර 02 කින් සමන්විතය.

1. සමුපකාර ක්ෂේත්‍රය පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම සම්බන්ධ ප්‍රශ්න පත්‍රය -
කාලය පැය 01 1/2 යි, ලකුණු 100.

2. බුද්ධි පරීක්ෂණය හා සාමාන්‍ය දැනීම - කාලය පැය 1 1/2 යි. (ලකුණු 100).

සුදුසුකම් ලැබීම සඳහා අවම වශයෙන් එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා අවම වශයෙන් ලකුණු 40% ක් බැගින් ලබා ගත යුතු අතර අනුමත පුරප්පාඩු සංඛ්‍යාව අනුව වැඩිම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන්, සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව බඳවා ගනු ලැබේ.

01. *සමුපකාර ක්ෂේත්‍රය පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම සම්බන්ධ ප්‍රශ්න පත්‍රය.-* ශ්‍රී ලංකාවේ සමුපකාර ව්‍යාපාරය, සාමාජීය ආර්ථික තොරතුරු, සමුපකාර සමිති ප්‍රඥප්තිය අළලා සැකසුණු ලිඛිත පරීක්ෂණයකි.

02. *බුද්ධි පරීක්ෂණය හා සාමාන්‍ය දැනීම.-* ජාතික හා ජාත්‍යන්තර කාලීන පුවත්, ගණිතමය කුසලතාවය හා තර්කානුකූල ශක්තිය මැන බැලීම සඳහා සැකසුණු බහුවරණ ශෛලීය ප්‍රශ්න පත්‍රයකි.

07. දැනට වාර්තා වී ඇති පුරප්පාඩු හා ඉදිරියේදී ඇතිවන පුරප්පාඩු, යථෝක්ත විභාගයෙන් සමත් අයවළුන් සිටීනම් එම අයගෙන් පිරවීම පිළිබඳ අවසාන තීරණය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

08. විභාග ගාස්තු වශයෙන් රු. 350 ක් පළාත් සභා ආදායම් ශීර්ෂ 20-03-90-01 ට බැරවන පරිදි ළඟම පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගෙවා ලබා ගන්නා ලද බ. ප. 1 ලදුපත අයදුම්පතට අමුණා එවිය යුතුය. එසේ මුදල් ගෙවා ලබා ගත් ලදුපත් හැර වෙනත් ආයතනවලට ගෙවා ලබා ගත් ලදුපත් හෝ මුදල් ඇණවුම් භාරගනු නොලබන අතර, කුමන හේතුවක් නිසා හෝ ගෙවූ විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන බව සැලකිය යුතුය.

09. *ඉල්ලුම් කළ යුතු පිළිවෙල.-*

09.1 මෙම නිවේදනයේ අග ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව ඒ 4 ප්‍රමාණයේ (සෙ. මී. 21 x 29) කඩදාසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත සකස් කර ගත යුතුය. සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2010.06.14 දිනට පෙර "ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.), නිදහස් චතුරශ්‍රය, කොළඹ 07" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ, "සමුපකාර සංවර්ධන නිලධාරී III පංතියට බඳවා ගැනීම - 2010" යනුවෙන් සඳහන් කළ යුතුය. (දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය ස්ථිර සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් සේවා ප්‍රධානියා මගින් එවිය යුතුය). ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

10. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2010.06.14 වේ.

11. නිවේදනයේ ඇති සුදුසුකම් සපුරා නොමැති අයගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා අදාළ නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවක දී අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ පත්වීම ලැබීමට ඇති හිමිකම අවලංගු කරනු ලැබේ. සෑම අයදුම්කරුවෙක්ම තනතුරට අදාළ සියලු සුදුසුකම් 2010.06.14 දිනට හෝ එදිනට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්යය වේ.

12. *අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය.-* තමා පෙනී සිටින විෂයය සඳහා විභාග ශාලා භාර නිලධාරියාට අයදුම්කරු තම අනන්‍යතාවය ඒත්තු ගැන්විය යුතුය. මේ සඳහා පහත සඳහන් ලියවිලිවලින් එකක් පිළිගනු ලැබේ :

1. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත.

2. වලංගු විදේශ ගමන් බලපත්‍රයක්.

*සටහන.-* විභාග ශාලාවේ දී තම අනන්‍යතාවය තහවුරු කිරීමට අපේක්ෂකයින් අපොහොසත් වුවහොත් ඔවුන් නුසුදුස්සන් ලෙස සලකනු ලැබේ.

13. කිසියම් අපේක්ෂකයකුට සිය ප්‍රවේශ පත්‍රය විභාගයට යටත් පිරිසෙයින් දින 07 කට පෙර නොලැබුණහොත් ඒ බව වහාම "ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.), නිදහස් චතුරශ්‍රය, කොළඹ 07" යන ලිපිනයට දැන්විය යුතුයි. එසේ දැනුම් දීමේ දී පහත විස්තර ඉදිරිපත් කළ යුතුය :

(අ) විභාගයේ නම,
(ආ) අපේක්ෂකයාගේ සම්පූර්ණ නම,
(ඇ) ලිපිනය,
(ඈ) අයදුම්පත්‍රය යොමු කළ ලිපිනය, ලියාපදිංචි තැපැල් අංකය හා දිනය.

14. යම් අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව පත්වීම ලැබීමට පෙර ඕනෑම අවස්ථාවක අනාවරණය වුවහොත් අපේක්ෂකත්වය අවලංගු කෙරෙනු ඇත. පත්වීම ලැබීමෙන් පසු හෝ දැන දැනම සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෝ නිරවද්‍ය තොරතුරු ඕනෑකමින් යටපත් කර ඇති බව හෝ අනාවරණය වුවහොත් සේවයෙන් පහ කෙරෙනු ඇත.

15. අයදුම්පත් කැඳවීමේ නිවේදනයට අදාළ කරුණු හෝ එම නිවේදනයෙන් අනාවරණය නොවන වෙනත් කරුණු සම්බන්ධයෙන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වේ.

වී. රාජපක්ෂ,
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

2010 මැයි මස 04 වැනි දින,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,
බස්නාහිර පළාත් සභා සංකීර්ණය,
කොළඹ.

**ආදර්ශ අයදුම්පත්‍රය**

*බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ සමුපකාර සංවර්ධන නිලධාරී III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2010*

විභාග අංකය : ☐

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

01. (අ) මුලකුරු සමග නම :—————.
(ආ) සම්පූර්ණ නම :—————.
(ඇ) ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

02. ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :—————.

03. (i) ස්ථිර ලිපිනය :—————.

(ii) ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය (අදාළ කොටුව තුළ ✓ ලකුණ යොදන්න):

කොළඹ ☐ ගම්පහ ☐ කළුතර ☐

(iii) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන 2010.06.14 දිනට අදාළ දිස්ත්‍රික්කයේ ස්ථිර පදිංචිය ඃ

අවුරුදු :—————. මාස :—————. දින :—————.

(iv) දුරකථන අංකය : පෞද්ගලික :————. රාජකාරී :————.

04. ස්ත්‍රී/පුරුෂ භාවය (අදාළ කොටුව තුළ ✓ ලකුණ යොදන්න) :

ස්ත්‍රී ඃ ☐ පුරුෂ : ☐

05. විභාගයට පෙනී සිටින මාධ්‍යය - (අදාළ කොටුව තුළ ✓ ලකුණ යොදන්න) :

සිංහල ☐ දෙමළ ☐ ඉංග්‍රීසි ☐

06. උපන් දිනය : වර්ෂය :————. මාසය:————. දිනය :————.

(i) අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වන .................. දිනට වයස ඃ

අවුරුදු :—————. මාස :—————. දින :—————.

(ii) ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන්නේ උපතින් ද/ලියාපදිංචි වීමෙන් ද?

07. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් ඃ අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ 3 යටතේ,

*(අ)* (i) අ.පො.ස. (උ.පෙළ) විභාගයට පෙනී සිටි වර්ෂය සහ නව විෂය නිර්දේශයද පැරණි නිර්දේශය යටතේ ද යන වග :—————.

(ii) විභාග අංකය :—————.

(iii)

| *විෂයය* | *ලබා ඇති සාමාර්ථය* |
|---|---|
| ......................... | ........................... |
| ......................... | ........................... |
| ......................... | ........................... |
| ......................... | ........................... |

*(ආ)* පොල්ගොල්ල ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ සමුපකාර සේවක සහතිකය (උසස් පෙළ) ලබා තිබේ ද? එසේ නම් එය ලබාගත් වර්ෂය හා සාමාර්ථය :—————.

(මෙම තොරතුරු පැහැදිලිව හා නිවැරදිව සඳහන් කර නොමැති නම් අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.).

08. විභාග ගාස්තු ගෙවූ ලදුපත් අංකය :—————.
දිනය :—————.
ලදුපත් ලබා ගත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :—————.

ලදුපත මෙම කොටුව තුළ නොගැලවෙන සේ අලවන්න.

09. ........................................................................... වන මා විසින් මෙම අයදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මා විසින් සපයා ඇති තොරතුරු සාවද්‍ය යැයි සොයා ගනු ලැබුවහොත් බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ සමුපකාර සංවර්ධන නිලධාරී III පංතියේ තනතුරට පත් කිරීම සඳහා වූ මාගේ හිමිකම නොසලකා හරිනු ලැබීමට ද මට විරුද්ධව විනයානුකූල කටයුතු කරනු ලැබීමට ද හැකි බව මම හොඳාකාරවම දනිමි.

__________,
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————.
අයදුම්කරුගේ අත්සන සහතික කිරීම.-
(අනවශ්‍ය වචන කපා හරින්න).

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ...................................... මයා./මිය./මෙනවිය මා පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු/ඇය ...................................... දින මා ඉදිරිපිට දී ඔහු/ඇය ගේ අත්සන තැබූ බවත්, සහතික කරමි.

සහතික කරන අයගේ නම :—————.
අත්සන :—————.
තනතුර හා නිල මුද්‍රාව :—————.

(මෙම සහතිකය රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු/සමාදාන විනිශ්චයකාරවරයෙකු/දිවුරුම් කොමසාරිස්වරයෙකු/නීතිඥයෙකු/යුධ හමුදාවේ හෝ ගුවන් හමුදාවේ අධිකාරි බලය ලත් නිලධාරියෙකු හෝ වර්ෂයකට රු. 2,37,060 නොඅඩු ඒකාබද්ධ වැටුපක් ලබන ස්ථිර තනතුරක් දරන රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නිලධාරියෙකු විසින් සහතික කළ යුතුයි.)

රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය.-

*(අනවශ්‍ය වචන කපා හරින්න)*

........................................................ මයා./මිය./මෙනවිය දැනට ................................................... අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ............................................ වශයෙන් ස්ථිර සේවයේ යෙදී සිටින බවත්, ඔහුගේ/ඇයගේ සේවය සතුටුදායක බවත් ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කර හෝ සානුකම්පිත විකල්පයක් වශයෙන් අකාර්යක්ෂමතාවය මත විශ්‍රාම ගන්වා ඇති/නැති බවත්, තනතුර අතහැර ගිය අයෙකු සේ සලකා ඇති/නැති බවත්, ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවට සහතික කරන අතර, මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා ඔහු/ඇය තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරින් නිදහස් කළ හැකිය/නොහැකිය.

__________,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව තබන්න).

දිනය :—————.

05-424